# භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
## Department of Treasury Operations

තැ.පෙ.1559, මහා භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, කොළඹ 01, ශ්‍රී ලංකාව
தபெ. 1559,பொது திறைசேரி, நிதி அமைச்சு, கொழும்பு 01, இலங்கை
P.O.Box: 1559, General Treasury, Ministry of Finance, Colombo 01, Sri Lanka

| | | | | |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் நாயகம்<br>Director General | දුරකථන<br>தொலைபேசி<br>Telephone | +94 11 2484729 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2431498 | ඊ-මේල්<br>மின்-அஞ்சல்<br>E-mail | dgto@tod.treasury.gov.lk |


| | | | | |
|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Number | TO/DCM/Daily Bal/2015 | ඔබේ අංකය<br>உமது இல<br>Your Number | දිනය<br>திகதி<br>Date | 2016.10. 12 |

භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක. **6/2016**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් සහ

යුද්ධ/නාවික/ගුවන් හමුදාපතිවරුන්,

**රජයේ නිල බැංකු ගිණුම් තුළ අක්‍රිය මුදල් ශේෂයන් දිගින් දිගටම පවත්වාගෙන යාම**

සමහර අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යනු ලබන නිල බැංකු ගිණුම් වල දිගු කාලයක් තිස්සේ රු.මි.100 ඉක්ම වූ අක්‍රිය මුදල් ශේෂයන් දිගින් දිගටම පවත්වාගෙන යනු ලබන බව භාණ්ඩාගාරය විසින් කරනු ලැබූ විමර්ශන වල දී නිරීක්ෂණය වී ඇත.

එබැවින් ඔබ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල පවත්වාගෙන යන සියළුම නිල බැංකු ගිණුම් හි ශේෂයන් දෛනිකව අධීක්ෂණය කරමින්, ගෙවීමට අනුමැතිය ලද වවුචර් මත පමණක් භාණ්ඩාගාරයෙන් අක්මුදල් අයදුම් කිරීමටත් අක්මුදල් ලැබුණ පසු ඉතා කෙටි කාලයක් තුළ එම ගෙවීම් අවසන් කර අදාල තුන් වන පාර්ශ්වය වෙත චෙක්පත් ප්‍රේෂණය කර ඇති බවටත් එම චෙක්පත් වලංගු කාල සීමාව තුල උපලබ්ධි වී ඇති බවටත් තහවුරු වීම සඳහා විධිමත් අභ්‍යන්තර වැඩ පිළිවෙලක් සකස් කර ගැනීමටත් කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

තවද ඉහත ක්‍රියා මාර්ග අනුගමනය කරමින් 2016.11.01 දින සිට ඉදිරියට ඔබ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යනු ලබන නිල බැංකු ගිණුම් වල ශේෂයන් අවම/ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාමටත් මු.රෙ.177 ප්‍රකාරව අතිරික්ත මුදල් භාණ්ඩාගාරය වෙත වහාම ප්‍රේෂණය කරන ලෙසටත් මෙයින් උපදෙස් ලබා දෙමි.

ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධව මු.රෙ. 396 විධිවිධාන ප්‍රකාරව විධිමත් පියවර නොගැනීමද නිල බැංකු ගිණුම් තුළ අක්‍රිය බැංකු ශේෂයන් දිගින් දිගටම පැවතීම සඳහා බලපානු ලබන බැවින් ඒ පිළිබඳව ද අවශ්‍ය කටයුතු කිරීම පිළිබඳව ඔබේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

**ආර්.එච්.එස්. සමරතුංග**

භාණ්ඩාගාර ලේකම්

පිටපත - විගණකාධිපති


| | | | | |
|---|---|---|---|---|
| කාර්යාලය<br>அலுவலகம்<br>Office | දුරකථන<br>தொலைபேசி<br>Telephone | +94 11 2484600<br>+94 11 2484700 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | +94 11 2484970<br>+94 11 2320042 | වෙබ් අඩවිය<br>இணையதளம்<br>Website | www.treasury.gov.lk |